පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව සති - පාසල

විෂය-පෙරදිග සංගීතය

සතිය-පළමු

ශ්‍රේණිය-13

සැකසුම-කේ.එල්. සමෝදා දක්ෂිණි

# කාර්ය පත්‍රිකාව-01

නිපුණතාව :-1.0 නිපුණතා මට්ටම :-1 . 2

ක්‍රියාකාරකම - හංසධ්වනි රාගය

## I කොටස

- පහත ප්‍රශ්න වලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.

1. හංසධ්වනි රාගයේ ථාටය වන්නේ,

i.කල්‍යාණ ii.භෛරවි iii.බිලාවල් iv.ඛමාජ් v.කාෆි

2. මධ්‍යමය හා ධෛවතය මෙම රාගයේ,

i. වාදි සංවාදි ස්වර වේ. ii.වර්ජිත ස්වර වේ. iii.විවාදි ස්වර වේ. iv.විකෘති ස්වර වේ. v.අනුවාදි ස්වර වේ.

3. හංසධ්වනි රාගය තුළ දැකිය හැකි රාගාංග වනුයේ,

i.කල්‍යාණ අංග හා මල්හාර් අංග ii.කාෆි අංග හා කානඩා අංග iii.ඛමාජ් අංග හා බිලාවල් අංග
. iv. බිලාවල් අංග හා කල්‍යාණ අංග v.බිලාවල් අංග හා ගෞඩ අංග

4. මෙම රාගයේ ගායන සමය වන්නේ,

i.රාත්‍රී ප්‍රථම ප්‍රහරය ii.රාත්‍රී දෙවන ප්‍රහරය iii.දිවා ප්‍රථම ප්‍රහරය iv.මධ්‍යම රාත්‍රිය
v.සර්ව කාලීන රාගයකි.

5. හංසධ්වනි රාගය කර්ණාටක සංගීත පද්ධතියේ කුමන මේල කර්තාවෙන් ජන්‍ය වූ රාගයක් ද?

i.මායා - මාල ගෞලව ii.හරි - කාම්බෝජ් iii.මේචිකල්‍යාණි iv.ධීර් ශංකරා බරණම්
v.නටි - භෛරවි

- ප්‍රශ්න අංක 6 සිට 8 දක්වා හිස්තැන් වලට සුදුසු පිළිතුර යොදන්න.

6. හංසධ්වනි රාගය ස්වර විස්තාර කිරීමේදී නි රි ස , ප රි ස යන ස්වර සංගති නිතර යෙදෙන බැවින් මෙම රාගය ………………………………………… මේලයට සුදුසු යැයි සමහර සංගීතඥයින්ගේ මතයයි.

7. දකුණු ඉන්දිය ගායකයෙක් වන හරිහරන් සමග ලෙස්ලි ලේවිස් විසින් ගයන ………………………………………….. ගීතය හංසධ්වනි රාගය පදනම් කරගෙන නිර්මාණය වී ඇත.

8. මෙම රාගයේ මුඛ්‍යාංගය ලෙස ……………………………………… යෙදේ.

## II.කොටස

- පහත සඳහන් සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. හංසධ්වනි රාගයට අදාල ස්වර සංගති දෙකක් ලියන්න.
2. හංසධ්වනි රාගයට අදාල පල්ටාවක් උච්ච සඩ්ජය දක්වා වර්ධනය කර ලියා දක්වන්න.
3. එම රාගයේ සර්ගම් ගීතය ස්ථායි අන්තරා නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න.

## කාර්ය පත්‍රිකාව-02

නිපුණතාව :-1.0 නිපුණතා මට්ටම :-1 . 2

ක්‍රියාකාරකම - හංසධ්වනි රාගය

I. කොටස

- පහත ප්‍රශ්න වලට ආදාල පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

1. හංසධ්වනි රාගය ………………………………. සංගීත පද්ධතියට ආවේණික රාගයකි.

2. මෙම රාගය …………………………. ජාති රාගයකි.

3. හංසධ්වනි රාගය ආශ්‍රිතව තනු නිර්මාණය වූ සිංහල සරල ගීතයක් ලෙස…………………………………………….... පෙන්වා දිය හැකිය.

4. ගග රිස, පප ගප ගග රිස,,……..යත ස්වර අභ්‍යාසයේ ඊළඟ පියවර ලෙස…………………………………………... යොදා ගත හැක.

5.මෙම රාගයේ ආරෝහණ ලෙස ………………………………… සහ අවරෝහණ ලෙස …………………………… ස්වර භාවිත කරයි.

6. මෙම රාගයේ වාදී ස්වරය ……………………………… වන අතර සංවාදිය……………………………… වේ.

## II. කොටස

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. හංසධ්වනි රාගයට අදාල පූර්වාලාපයක් ලියා දක්වන්න. (ස්වර 15 ක් 20 ක් පමණ ප්‍රමාණවත්ය)

2. මෙම රාගයට ආදාල මධ්‍ය ලය ගීතයක ගීත ස්වර ප්‍රස්ථාරය හෝ වාදිතයක ස්වර ප්‍රස්ථාරය නියමිත තාල සංඥා සහිතව ස්ථායි අන්තරා කොටස් ප්‍රස්ථාර කර දක්වන්න.

3. ඉහත ඔබ ලියූ මධ්‍ය ලය ගීතයට හෝ වාදිතයට ආදාල මාත්‍ර 8 ක තානාලංකාර 2 ක් හා මාත්‍රා 16 ක තානාලංකාරයක් නියමිත තාල සංඥා සහිතව ප්‍රස්ථාර කරන්න.